දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2484637
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 94-11-2484614
ෆැක්ස් / பெக்ஸ் / Fax: 94-11-2431458

මහාභාණ්ඩාගාරය
பொதுத் திறைசேரி
General Treasury

මහලේකම් කාර්යාලය (1වෙනි මහල)
செயலகம் (1 ஆம் மாடி)
The Secretariat (1st Floor)

කොළඹ-01
கொழும்பு - 01
Colombo-01

ඊමේල් / ஈமெயில் / E-Mail: pubfin@pfd.treasury.gov.lk

# රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
# அரச நிதித் திணைக்களம்
# DEPARTMENT OF PUBLIC FINANCE

මගේ අංකය / எனது இல. / My No.: PF/FS/01/1
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2008.09. 17

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක: 432

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දිස්ත්‍රික් ලේකම්වරුන්,

පළාත් පාලන ආයතන ප්‍රධානීන්,

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ අධිකාරීවල සභාපතිවරුන් වෙත.

## <u>රාජ්‍ය මුදල් චක්‍රලේඛ හා තොරතුරු අන්තර්ජාලය මගින් ලබාගැනීම හා " භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපි අංක: මුදල් " හා "රාජ්‍ය මුදල් චක්‍රලේඛ" උපදෙස්වල වලංගු භාවය තහවුරු කර ගැනීම</u>

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙහි (www.treasury.gov.lk) දක්වා ඇති දෙපාර්තමේන්තු යටතේ වූ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට අදාල වෙබ් අඩවිය (www.treasury.gov.lk/FPPFM/pfd) 2008.10.01 දින සිට පහත සඳහන් ක්‍රියා මාර්ගයන්ට යටත්ව ක්‍රියාත්මක වන බව කරුණාවෙන් සලකන්න.

**01. රාජ්‍ය මුදල් සහ ප්‍රසම්පාදන චක්‍රලේඛ පළ කිරීම**

i. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් 2007.01.01 වෙනි දින සිට මේ දක්වා නිකුත් කර ඇති චක්‍රලේඛයන් මෙම වෙබ් අඩවියේ වර්ෂ අනුපිළිවෙලින් ඇතුළත් කර ඇති අතර, ඉදිරියේදී නිකුත් කරනු ලබන චක්‍රලේඛ ඒ ආකාරයෙන්ම වර්ෂ අනුව කාලක්‍රමානුගතව පෙන්නුම් කිරීමට කටයුතු කරනු ලැබේ.

ii. 1995.01.01 දින සිට 2006.12.31 දින දක්වා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ නැවත සමාලෝචනයකට භාජනය කෙරමින් පවතී. එසේ සමාලෝචනය කිරීමෙන් පසුව එම චක්‍රලේඛවලින් වර්තමානයට අදාල වන හා තව දුරටත් ක්‍රියාත්මක විය යුතු චක්‍රලේඛ ඉදිරියේදී වර්ෂ අනුව මෙම වෙබ් අඩවියට ඇතුලත් කිරීමට කටයුතු කරනු ඇත.

iii. එසේම, 1995.01.01 දිනට පෙර නිකුත් කරන ලද චක්‍රලේඛයන්ද සමාලෝචනයට භාජනය කර අවශ්‍ය සංශෝධන සහිතව නව චක්‍රලේඛ වශයෙන් නිකුත් කර ඉහත කී වෙබ් අඩවියට ඉදිරියේදී ඇතුලත් කිරීමට පියවර ගනු ඇත.

iv. 2008.03.17 දිනැති හා අංක PF/429 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සඳහන් පරිදි ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනයේ කටයුතු අවසන් කිරීම හා ප්‍රසම්පාදන කටයුතු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත පැවරීම හේතුවෙන් 2008 පෙබරවාරි මස 29 වැනි දින දක්වා එවකට පැවති ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායනය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ද මෙම වෙබ් අඩවියේ චක්‍රලේඛ යටතේ වෙනම දක්වා ඇත. ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනය නිකුත් කළ සියළුම චක්‍රලේඛයන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයන් ලෙස සැලකිය යුතුය.

v. 2008.02.29 වැනි දිනට පෙර ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනය විසින් නිකුත් කළ චක්‍රලේඛයන්ට අදාල සංශෝධනයන් හෝ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල නව චක්‍රලේඛයන් ඉදිරියේදී නිකුත් කරනු ලබන විට එම චක්‍රලේඛ රාජ්‍ය මුදල් චක්‍රලේඛ වශයෙන් ඉහත කී වෙබ් අඩවියේ දක්වනු ලැබේ.

**02. මුදල් රෙගුලාසි සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයන් හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයන් වැනි ප්‍රකාශන.**

i. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා නිකුත් කරන ලද ප්‍රකාශන හා ඉදිරියේදී නිකුත් කරනු ලබන ප්‍රකාශන රාජ්‍ය මුදල් ප්‍රකාශන යටතේ වෙබ් අඩවියේ දක්වනු ඇත.

ii. එවකට පැවති ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනය විසින් 2008.02.29 වැනි දින දක්වා නිකුත් කරන ලද සියළුම ප්‍රකාශනයන් මෙම වෙබ් අඩවියේ ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනයේ ප්‍රකාශන යටතේ පෙන්නුම් කර ඇති අතර එම ප්‍රකාශන මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන ලෙස ඉහත 1 (iv) ඡේදය යටතේ දක්වා ඇති චක්‍රලේඛය (PF/429) අනුව සැලකිය යුතුවේ.

iii. ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනය මගින් 2008.02.29 වැනි දින දක්වා නිකුත් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයන් හෝ කාර්ය සංග්‍රහයන් සම්බන්ධයෙන් යම්කිසි සංශෝධනයක් සිදු කරන්නේ නම් එම සංශෝධනයන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු ප්‍රකාශන යටතේ දක්වනු ඇත.

**03.** මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ නම්, දුරකතන අංක හා විද්‍යුත් තැපැල පිළිබඳ තොරතුරු ඔබගේ පහසුව සඳහා මෙම වෙබ් අඩවියේ ඇතුළත් කොට ඇත.

**04.** ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතනයේ නමින් ක්‍රියාත්මක වූ www.npa.gov.lk වෙබ් අඩවිය 2008.10.01 වැනි දින සිට අත්හිටුවන ලද බවද කරුණාවෙන් සලකන්න.

**05.** භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛවල නිර්ව්‍යාජභාවය තහවුරු කර ගන්නා ලෙස උපදෙස් දෙමින් භාණ්ඩාගාර ලේකම්වරයා විසින් 2007.06.29 දින නිකුත් කරන ලද ලිපියෙහි 4 වන ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු කැමැත්තෙමි. ඒ අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට අදාළ අතීතයේදී නිකුත් කරන ලද ("භාණ්ඩාගාර ලිපි අංක : මුදල් " යටතේ හෝ "රාජ්‍ය මුදල් චක්‍රලේඛ" යටතේ වූ චක්‍රලේඛ උපදෙස්) හා අනාගතයේදී නිකුත් කරනු ලබන චක්‍රලේඛවල වලංගුභාවය එම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඩී.අබේසූරිය මයාගෙන් (දු.අ : 011 - 2484734) හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂක එන්.එම්.ඩී නවරත්න මයාගෙන් (දු.අ : 011 - 2484632) තහවුරු කර ගන්නා මෙන්ද කාරුණිකව දන්වමි.

එස්.අබේසිංහ
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්

පිටපත: විගණකාධිපති - දැ.ගැ.පි.